The Journal of the Faculty of Humanities (JHU) (2024), Volume 32, Issue 2, 94-108
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (Online)

# නාග සංකල්පයේ ශාබ්ධික හා බෞද්ධ සංස්කෘතික භාවිතාව

ආචාර්ය ඩබ්. ඒ. ගාමිණී විජයසිංහ

## Abstract

The concept of Naga is one of the most prominent topics that have been discussed in various societies of world from various backgrounds. Oriental societies including India, China, Korea and Japan have tried to explain the concept of Naga on a religious basis. Among them, Hinduism is the main religion in India. It should be emphasized that Hindu belief in God is interrelated with the Naga concept. Relative to the cultural background, the concept of Naga becomes a well - known proposition in Buddhist culture as well. It is also possible to identify the factors that confirm connection of the serpent concept with the well- known phenomena of Buddhist history as well as Buddha's teachings, the concept of snake is included in the Buddhist culture in general.

**Keywords:** *concept of Naga, cultural background, Buddhist culture, Buddha's teachings*

## හැඳින්වීම

නාග යන්න වනාහි බහුවිධ අරුත් ගෙන දෙන වචනයකි. එ මෙන් ම එය බහුතර සංසිද්ධි පදනම් කරගනිමින් බොහෝ සෙයින් කුතුහලයට හා විමතියට ලක්වූ නාමයක් බවට පත්ව ඇත. එ නිසා ව්‍යවහාරික සමාජයේ නොයෙක් දෘෂ්ටිකෝණ ඇසුරින් මේ පිළිබඳ තොරතුරු බහුවිධ පසුබිම් යටතේ හුවමාරුවෙමින් පවතී. විද්‍යාත්මකව සැලකීමේ දී උරග කුලකයෙහි ලා සැලකෙන කඳුකර උස් ප්‍රදේශ

හැරුණුවිට අනෙක් බොහෝ සමානාය දේශගුණික පරිසරවල දී හමුවන විෂ සහිත සර්පයකු වශයෙන් සැලකෙන නයා පිළිබඳ මතවාද බාහුල්‍යතාව නිසා ම එය හුදෙක් ම සංකල්පයක් බවට පත් ව ඇත. එහෙයින් නාග සංකල්පය හා බැඳුණු නන්වැදුරුම් දෘෂ්ටිවාද මෙන් ම ලෝකයේ බොහෝ ජනසමාජයන්හි පවත්නා සාම්ප්‍රදායික ඇදහිලි හා විශ්වාස හා ඊට සමාන්තර ව ගොඩනැගුණ නන්වැදෑරුම් අභිචාරාත්මක පූජා චරිත්‍ර ද දැකගත හැකි ය. නාග වචනය හා සම්බන්ධ ශබ්දාර්ථ ව්‍යවහාරය මෙන් ම නාග සංකල්පය හා තදනුබද්ධ විශ්වාස විවිධ සංස්කෘතීන්හි භාවිතයට ගෙන ඇති අයුරු බෞද්ධ සංස්කෘතික පසුබිම ඇසුරින් විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය මගින් සිදුවේ.

## පර්යේෂණ ගැටලුව

මෙම පර්යේෂණයෙහි ලා නාග ශබ්දයේ අර්ථ විග්‍රහය විභාග කිරීම හා පොදුවේ සමාජ සංස්කෘතික සන්දර්භය තුළ නාග සංකල්පය සමග බද්ධ ව පවත්නා බෞද්ධ සාහිත්‍යයික විමර්ශන, සංස්කෘතික ඇදහිලි හා විශ්වාස පදනම් කරගත් අභිචාරවිධි කවරේ ද එවැනි අභිචාරයන්හි යථාර්ථය කුමක්ද ආදී වශයෙන් දැක්වෙන විෂය පරාසය ගවේෂණය කිරීම හා මෙවැනි අධ්‍යයනයක උපයෝගීතාව අනාවරණය කිරීම වශයෙන් දැක්වෙන කරුණු මෙහි පර්යේෂණ ගැටලුව යි.

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයෙහි ලා මූලික වශයෙන් පහත සඳහන් අරමුණු සාධනය අපේක්ෂා කෙරේ. ඒ අතර නාග ශබ්දයේ නිශ්චිත අරුත් විභාග කිරීම ප්‍රධාන වශයෙන් අදාළ කරගැනේ. එ මෙන් ම නොයෙක් වෘත්තාන්තයන් හි හා ඇදහිලි විශ්වාසයන් හි නාග ශබ්දය භාවිතයට ගෙන ඇති අයුරු ඓතිහාසික වාර්තානුසාරයෙන් විමර්ශනය කිරීම ද මෙහි ලා අදාළ කරගැනේ. මේ හැරුණුවිට නාග සංකල්පය පිළිබඳ බෞද්ධ මූලාශ්‍රය විමර්ශනය කිරීම හා බෞද්ධ සංස්කෘතිය හා නාග සංකල්පය අතර පවතින සබැඳියාව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම අරමුණු කරගැනේ.

## සාහිත්‍ය විමර්ශනය

නාග සංකල්පය හා තදනුබද්ධ පසුබිම වනාහි සමාජයේ බහුවිධ පිරිස් අතර අවධානය තහවුරු කරගත් විෂයක්ෂේත්‍රයකි. ජානශ්‍රැතික, ආගමික, අභිචාරමය හා සාහිත්‍යයික ආදී නොයෙකුත් දෘෂ්ටිකෝණ ඇසුරින් මෙම විෂය පිළිබඳ විමර්ශනය කළ හැකිය. ඒ අතර ලක්දිව නාග ජනයා පිළිබඳ ඓතිහාසික හා සාහිත්‍යයික විමර්ශනයක් යන ශීර්ෂ පාඨයෙන් යුත් THE JOURNAL OF LANGUEGE AND CULTURE සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්.එම්. කල්‍යාණි විජේසුන්දර විසින් පළ කළ ලිපිය මගින් ලාංකේය සමාජය මුල් කරගත් නාග සංකල්පයේ පසුබිම පිළිබඳ කෙරෙන විග්‍රහයක් හඳුනාගත හැකිය. එ මෙන් ම මහාචාර්ය චන්න සුදත් ජයසුමනගේ *පෙනෙන නාගයෝ සහ නොපෙනෙන නාගයෝ* ලෙස අන්තර්ජාලයේ පළ කර ඇති ලිපිය ඇසුරින් මෙම ක්ෂේත්‍රයේ තවත් සැලකිය හැකි විෂය පරාසයක් අවධාරණය කෙරේ. එ මෙන් ම සුජිත් අක්කරවත්ත *ඉතිහාසයේ සැඟවුණ කථා* යන ශීර්ෂය යටතේ රචිත ලිපියේ මේ පිළිබඳ මූලාශ්‍රයාගත තොරතුරු සමූහයක් එක් කෙරේ. එ සේ ද වුවත් ඔවුන්ගේ විමර්ශනයෙන් මග හැරුණු එහෙත් මෙම විෂයක්ෂේත්‍රයෙහි ලා අනාවරණය කළ යුතු විශේෂිත ක්ෂේත්‍රයක් වන නාග සංකල්පයානුබද්ධ වචනාර්ථ විග්‍රහය මෙන් ම බෞද්ධ සංස්කෘතිය විෂයක්ෂේත්‍රයෙහි ලා නාග ව්‍යවහාරයේ භාවිතය කේන්ද්‍රීය විමර්ශනය බවට පත්වන නිසා සාපේක්ෂ වශයෙන් මෙම පර්යේෂණය වඩාත් සුවිශේෂතාවෙන් යුක්ත වේ.

## සාකච්ඡාව

නාග යන වචනයෙන් නයා, ඇතා, නාගස[1], කෙලෙස් ප්‍රහීන කළ තැනැත්තා[2], බුදුරජාණන් වහන්සේ[3], රහතන් වහන්සේ, උත්තම පුද්ගලයා, උපසම්පදා අපේක්ෂක භික්ෂූන් වහන්සේ සඳහා තාවකාලිකව සම්මත කරගත් නාමය, නාග ලෝකයේ වාසය කරන නාග පිරිස, නාග ලොව සත්ත්ව සමූහයා, නාග ගෝත්‍රික මනුෂ්‍ය

---

1. *සුමංගල ශබ්දකෝෂය 2* (1952) සෝරත නාහිමි, වැලිවිටියේ මහාබෝධි යන්ත්‍රාලය කොළඹ 462 පිටුව
2. බණ්ඩාර, සිරිනාම ඒ.ජී. (2006) *බුදුගුණ නාමාවලී,* බුද්ධනාම විශ්වකෝෂය කතෘ ප්‍රකාශන, 305 පිටුව.
3. එම 302, 303 පිටු.

කොට්ඨාසය[4] ආදි අදහස් ප්‍රකාශ වේ. මෙහි නයා යන්නෙන් පෙනය කිරීමේ විශේෂ හැකියාවක් සහිත සාමාන්‍ය පාරිසරික ව්‍යවහාරයේ නිතර හමුවන සර්පයා පිළිබඳ ප්‍රකාශ වේ. එ මෙන් ම උරග කුලයට අයත් මෙම සත්ත්වයා දිවා කාලයේ ඉතා ක්‍රියාශීලී ව හැසිරිය හැකි අතර උස් කඳු මුදුන් හැර බහුතර දේශගුණික තත්ත්වයන් තුළ ජීවත් විය හැකි විෂ සහිත බවින් යුක්ත වූවෙකි. බෞද්ධ මූලාශ්‍රය තුළ මේ පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණ ඇසුරින් සාකච්ඡා වන බොහෝ විස්තර ද දැකගත හැකි ය. මීට අමතර ව නාගාර්ථයෙන් නයා පිළිබඳ දැක්වෙන විස්තර ද ඒ අතර හඳුනාගත හැකි ය. විශේෂයෙන් සංයුත්ත නිකායේ නාග සංයුත්තය මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රය හා තවත් අවස්ථා ගණනාවක දී ම මෙම ප්‍රස්තුතයට අදාළ බොහෝ සන්දර්භ යටතේ කෙරෙන විස්තර දැකගත හැකි ය. එ මෙන් ම හස්තියා හෙවත් ඇතා සඳහා ද පර්යාය වශයෙන් නාග ශබ්දය ව්‍යවහාර කෙරේ.

සංයුත්ත නිකායේ ආසිවිසෝපම සූත්‍රයේ දරුණු විෂ සහිත සර්පයින් වර්ග හතරක් පිළිබඳ විස්තරයක් දැක්වේ.[5] කට්ඨමුඛ, පූතිමුඛ, අග්ගිමුඛ හා සත්තමුඛ වශයෙන් හඳුනාගැනෙන[6] එම සර්පයින්ගේ විෂ ස්වභාවය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ සාපේක්ෂක විශේෂතා පිළිබඳ දීර්ඝතර විවරණයක් සංයුත්ත නිකායට්ඨකථාවේ දක්නට ලැබේ. කට්ඨමුඛ සර්පයාගේ විෂ ශරීර ගතවුවහොත් ශරීරයේ සියලු අංග වියළි ලී කැබැල්ලක් මෙන් දෘඪ ස්වභාවයක් ගනී.[7] එහි දී ශරීරයේ නම්‍යශීලී සන්ධි මගින් කිසියම් උලකින් අනින්නාක් මෙන් වේදනාවක් ගෙන දීමට ඉවහල් වන බව වැඩිදුරටත් දැක්වේ. එ මෙන් ම පූතිමුඛගේ විෂ මගින් ශරීරය ඉදී නරක් වී ගොස් ඕජස් ගලන කොස් ගෙඩියක් මෙන් පැසවා වැගිරෙන ස්වභාවයට පත්වන බව කියැවේ.[8] එ මෙන් ම අග්ගිමුඛගේ විෂ මගින් සකලාංගයම දැවී ගොස් අළු දූවිලි බවට

---

4. ලියනගේ සිරි, *බෞද්ධ ශබ්දකෝෂය* (2014), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 845 පිටුව
5. සෙය්‍යථාපි භික්ඛවේ චත්තාරෝ ආසිවිසා උග්ගතේජා ඝෝරවිසා සංයුත්ත නිකාය චතුර්ථ භාගය (2006) බු.ජ.ත්‍රි.ග්‍ර. පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 340 පිටුව
6. සංයුත්තනිකායට්ඨ කථා (1929) ආසිවිසෝපම සුත්තවණ්ණනා හේවාවිතාරණ මුද්‍රණ
7. තේසු කට්ඨමුඛේන දට්ඨස්ස සකලසරීරං සුක්කට්ඨංවිය ථද්ධං හෝති, එම
8. පූතිමුඛේන දට්ඨස්ස පක්කපූතිපනසං විය විපුබ්බකභාවං අපජ්ජිත්වා පග්ඝරති, එම

පත්වන බව ප්‍රකාශිත ය.[9] තව ද සත්ථමුඛ විෂ මගින් ශරීරයේ සියලු කොටස් අකුණු සැරක් වැදුණාක් මෙන් සිදුරු බවට පත්වේ යැයි සඳහන් වේ.[10] මීට අමතර ව යථෝක්ත සර්පයින්ගේ විෂ පැතිරීමේ ශීඝ්‍රතාව පිළිබඳ සාපේක්ෂ වශයෙන් දැක්වෙන විවරණයක් ද මෙයට සමාන්තර ව සංයුත්තනිකායට්ඨකථාවේ විග්‍රහ වේ.

එ මෙන් ම සංයුත්ත නිකායේ ම දක්නට ලැබෙන නාග සංයුත්තයට අයත් සූත්‍ර තුළ නාග ස්වභාවය පිළිබඳ විස්තර දැකගත හැකි ය. එහි එන විග්‍රහය අනුව අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික වශයෙන් ඉපදෙන නාග භවයන් හතරක් දක්නට ලැබෙන බව කියවේ.[11] මේ අය අතුරින් ඕපපාතික නාගයින් වඩාත් උසස් වේ යැයි සඳහන් වේ.[12] තව ද ඕපපාතික භවයක් ලැබීමෙහි ලා ඉවහල් වන හේතු සාධක එනම් කර්ම විපාක පිළිබඳ විවරණයක් ද ඊට සමාන්තර ව දක්නට ලැබේ.[13]

ආශ්චර්යමත් හැසිරීම් ඇති නොයෙක් වේශයන්ගෙන් පෙනී සිටිය හැකි සුවිශේෂිත ජීව කොට්ඨාසයක් වශයෙන් මෙම නාග ප්‍රජාව හඳුනාගත හැකි ය. බෞද්ධ සාහිත්‍යයේ ප්‍රකට සංසිද්ධි මීට අදාළ ව උපුටා දැක්විය හැකි ය. ඒ අතර මහාවග්ගපාලියේ මහාක්ඛන්ධකයේ දැක්වෙන ප්‍රවෘත්තියක් අනුව එක්තරා නාගයෙක් තම නාගභවය පිළිබඳ බෙහෙවින් කළකිරී එයින් මිදී මනිස් භවයක් ලැබීමට අවශ්‍ය කුසල රැ ස් කිරීමේ අපේක්ෂාවෙන් බුද්ධ ශාසනයේ පැවිදි බව ලැබීමට තීරණය කර ඇත. අනතුරු ව මානවක වේශයක් මවාගෙන භික්ෂූන් වෙත ගොස් පැවිද්ද අයැද සිටි බව කියැවේ.[14] එම ඉල්ලීම අනුව භික්ෂූහු ඔහු ව පැවිදිකොට උපසම්පදාව ද ලබාදුන්හ. අනතුරු ව එම භික්ෂු වෙස්

9. අග්ගිමුඛේන දට්ඨස්ස සකලසරීරං ඣායිත්වා භස්මමුට්ඨිවිය ථුසමුට්ඨිවිය විප්පකිරීයති, එම
10. සත්තමුඛේන දට්ඨස්ස සකලසරීරං භිජ්ජති අසනිපාතට්ඨානං විය මහානිබාදනේන ඛතසන්ධිමුඛං වියච හෝති, එම
11. චතස්සෝ ඉමා භික්ඛවේ නාග යෝනියෝ... අණ්ඩජා නාගා ජලාබුජා සංසේදජා නාගා ඕපපාතිකා නාගා, සංයුත්ත නිකාය (2006), නාග සංයුත්තය සුද්දික සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර. පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
12 ඕපපාතිකා නාගා පණීතතරා එම පණීතතර සූත්‍රය
13 එම
14 අථඛෝ සෝ නාගෝ මානවකවණ්ණෙන භික්ඛු උපසංකමිත්වා පබ්බජ්ජං යාචි, මහාවග්ගපාලි (2006), මහාක්ඛන්ධකය බු.ජ.ත්‍රි.ග්‍ර. පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 214 පිටුව.

ගත් නාග තෙමේ තවත් එක්තරා භික්ෂූන් වහන්සේ කෙනෙක් සමඟ ප්‍රත්‍යන්ත විහාරයක වාසය කිරීමට ගියේ ය. අනතුරු ව එම භික්ෂූන් වහන්සේ අලුයම නැගිට භාවනා කිරීම සඳහා එළිමහනට ගොස් ඇත. ඒ අතරතුර එම නාග තෙමේ සැක රහිත ව ම නින්දට වැටුණේ ය. වාර්තා වන අන්දමට සියලු විහාරය නාගයාගෙන් පිරුණ අතර එම අවස්ථාවේ ආරාමයට පිවිසි අනෙක් භික්ෂූන් වහන්සේ නාගයාගෙන් පිරුණු විහාරය දැක පුදුම සහගත ව නැගූ ශබ්දයෙන් අවදි වුණ නාග තෙමේ සියලු විස්තර පැවසූ බව දක්වේ. අනතුරු ව මෙම ප්‍රවෘත්තිය බුදුරදුන්ට සැලවීමෙන් බුදුරජාණන් වහන්සේ නාගයාගේ සිය නාග භවය වෙනස් කරගැනීමට අවශ්‍ය පිළිවෙත් දක්වාලූ සේක. එමතු ද නොව එවැනි තිරිසන් යෝනියෙහි උපත ලැබූවන් උපසම්පදා නොකිරීමටත් උපසම්පදාව ලබා දී ඇත්නම් උපැවිදි කිරීමටත් අනුදැන වදාරා ඇත.[15] විශේෂයෙන් සිය වේශය වෙනස් කළ හැකි මෙවැනි නාගයින්ගේ ගති ස්වභාවය, නිදාගැනීමේදී හා ලිංගිකව එක්වීමේ දී ප්‍රකෘති ස්වභාවයට පත්වන බව තථාගතයන් වහන්සේ විසින් මෙහි දී කළ දේශනාව ඇසුරින් තහවුරු කරගත හැකි ය.[16]

විශේෂයෙන් බුදුසිරිතේ නොයෙක් සංසිද්ධි හා අවස්ථා රැසක් සමඟ නාග සංකල්පය භාවිත වී ඇති අයුරු ද මෙහි ලා අවධාරණය කළ යුතු තවත් ක්ෂේත්‍රයකි. ඒ අනුව තථාගතයන් වහන්සේ බුද්ධත්වයෙන් අනතුරු ව සත් සතිය ගත කළ කාල පරාසයට අයත් මුචලින්ද නාග දරණය හා සම්බන්ධ සංසිද්ධිය බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙන වඩාත් ප්‍රකට සිදුවීමකි. සත් සතියේ විශ්වසනියත්වය පිළිබඳ නොයෙකුත් විචාරක මතවාද පැවැතිය ද ඍද්ධිමත් නාගයින්ගේ පැවැත්ම පිළිබඳ නිශ්චිත අදහසක් ගොඩනැගීමෙහි ලා උපයෝගී කරගතහැකි වෘත්තාන්තයක් වශයෙන් එහි උපයෝගීතාව අතිශයින් වැදගත් වේ. උදානපාලියේ මුචලින්ද වර්ගයේ මුචලින්ද සූත්‍රයේ සඳහන් වන පරිදි තථාගතයන් වන්සේ උරුවෙල් ජනපදයෙහි නෙරංජනා නදී තීරයට ආසන්නයේ මිදෙල්ල ගස මුල සමාධි සුවයෙන් වැඩ සිටින අතරතුර පැමිණි සැඩසුළං සහිත අකල් වර්ෂාවෙන් පීඩා නොවන පරිදි සිය පෙණමඩලෙන් හා දරණින් උන්වහන්සේ ආරක්ෂා කළ අතර වර්ෂාව

15. තිරච්ඡානගතෝ භික්ඛවේ, අනුපසම්පන්නෝ න උපසම්පාදේතබ්බෝ උපසම්පන්නෝ නාසේතබ්බෝ ති, එම

16. ද්වේ මේ භික්ඛවේ පච්චයා නාගස්ස සභාවපාතුකම්මාය. යදාච සජාතියාය මේථුනං ධම්මං පතිසේවති, යදාච විස්සත්ථෝ නිද්දං ඔක්කමති, එම 216 පිටුව

අවසන් වූ පසු කුමර වේශයක් මවාගෙන බුදුරදුන් ඉදිරියේ පෙනී සිට උන්වහන්සේ වන්දනා කළ බව වැඩිදුරටත් සඳහන් වේ.[17]

මේ හැරුණුවිට ධර්මාශෝක මහරජතුමා බුදුදහම පිළිබඳ හඳුනාගැනීමෙන් අනතුරු ව සිය රාජාභිෂේකයට පූර්වයෙන් කළ යුතු ආගමික කෘත්‍යයන් අතර බුද්ධ වන්දනාව පිණිස සිත් පහළ වූයෙන් එවකට බුදුරදුන් නියෝජනය වන බුද්ධප්‍රතිමා නිර්මාණය වී නොපැවති හෙයින් ඊට පිළියම් වශයෙන් සිව්බුදුවරයාණන් වහන්සේලා ම සියැසින් දක ඇති කල්පයක් පමණ ආයුෂ ඇති මහාකාල නම් නාග රාජයා විසින්[18] බුදුරුවක් මවා පෙන්වන ලද බව වැඩිදුරටත් දක්වේ. එ සේ ම ජයශ්‍රී මහ බෝධීන්වහන්සේ මෙරටට වැඩම කළ අවස්ථාවේ නාගයින් හා සම්බන්ධ නොයෙක් සිදුවීම් පිළිබඳ වාර්තා දකගත හැකි ය. ඒ අතර නාගයින් විසින් සතියක් පුරාවට බෝධීන්වහන්සේට පුදපූජා පැවැත්වූ බව ද දක්වේ.[19]

මීට අමතර ව නාග ශබ්දය ගෝත්‍ර ව්‍යවහාරය සමඟ ද පවතින සබැඳියාව සැලකිල්ලට ගත හැකි ය. ලාංකේය ඉතිහාසයේ දක්වෙන සිද්ධි ගණනාවක් මෙයට අදාළ ව දක්විය හැකි ය. මෙරට ආර්යාගමනයට පූර්වයේ සිට පැවැති දේශීය ජන සංයුතිය යක්ෂ, රාක්ෂ, නාග හා දේව යන ගෝත්‍රික පිරිසකගෙන් සමන්විත වූ බව පිළිගැනේ.[20] මෙම පිරිස් හුදෙක් ම යක්ෂ ආදී ලෙස ව්‍යවහාරයේ පවතින වෙනත් සුවිශේෂිත ජීව කොටස් නොවූ අතර ඒ ඒ අයට ආවේණික වූ ඇදහිලි හා විශ්වාස ප්‍රකරව ප්‍රචලිත වූ ජනවර්ග වශයෙන් හඳුනාගත හැකි ය. මෙම පසුබිම තුළ ලාංකේය ආදිවාසී ජන කොටස් අතර නාග ගෝත්‍රික ප්‍රජාව හමුවේ. මීට අදාළ ව තථාගතයන් වහන්සේගේ ලංකාගමනය පිළිබඳ තොරතුරු වාර්තා වන මූලාශ්‍රය අනුව මිණිපළඟක් අරභයා

17. අථ බෝ මුචලින්දෝ නාගරාජා සකභවනා නික්ඛමිත්වා භගවතෝ කායං සත්තක්ඛත්තුං භෝගේහි පරික්ඛිපිත්වා උපරිබුද්ධනි මහන්තං ඵණං විහච්ච අට්ඨාසි, එම 06 පිටුව

18. චතුන්නං බුද්ධානං අධිගතරූපදස්සනං මහාකාල නාගරාජානං, සමන්තපාසාදිකා, 14 පිටුව හේ.මු.

19. සත්තාහං නාගරජ්ජේන පූජාහි විවිධාහිච පූජයිත්වාන ආනෙත්වා නාවාහි ඨපයිංසු තේ, මහාවංසය, පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි සංස්කරණය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, (1959), 19 පරි. 21ගාථාව

20. විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ සිංහල ශාෂාවේ ඉතිහාසය, (1965) ඇම්. ඩී. ගුණසේන සහ සමාගම කොළඹ, 04 පිටුව.

ඇති වූ චුලෝදර හා මහෝදර දෙදෙනාගේ ආරවුල සමථය කිරීම පිණිස බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පස්වැනි වර්ෂයේ බක් මස නාගදීපයට වැඩම කළ බව දක්වේ.[21] මෙම දෙදෙනා නාගයින් ලෙස දැක්වේ. එනම් නාග නමින් හැඳින්වූ ගෝත්‍රය යි. විශේෂයෙන් චූලෝදර මහෝදර යන්නෙන් මහත් හා කුඩා කුසක් පැවැතීම යන්නෙන් ව්‍යවහාරයේ පැවැතියත් මෙම දෙදෙනා ඥාතීත්වය අනුව මාමා සහ බෑණාය (මහෝදරගේ සහෝදරියගේ පුත්‍රයා චූලෝදරය). නො එ සේ නම් මවගේ සහ දියණියගේ දරුවන් දෙදෙනා වන මහෝදරට මහබඩ හෙවත් මවගේ කුසින් (මහබඩ) බිහිවීම නිසා මහෝදර නාමය ද දියණියගේ කුසින් (කුඩාබඩ) බිහිවූ හෙයින් චූලෝදර යන නම ද පටබැඳි අයුරු අවධාණය කළ යුතු ය. එ මෙන් ම මනිඅක්ඛික නාරජුගේ ඇරයුමෙන් බුදුරදුන් තෙවෙනි වර ලංකාවට වැඩම කරන ලද බව සඳහන් වේ.[22] මේ අයුරින් ගෝත්‍ර ව්‍යවහාරය ලද නාග ප්‍රජාවගේ ශ්‍රී ලාංකේය ආස්ථානය පිළිබඳ කෙරුණු පර්යේෂණ රැසක් හඳුනාගත හැකි ය.[23]

විශේෂයෙන් උපසම්පදාව ආපේක්ෂා කරන සාමණේර භික්ෂූන්වහන්සේ වෙසෙසීම පිණිස ද නාග යන ව්‍යවහාරය භාවිත කෙරේ. මෙම යෙදුම හුදෙක් ම තථාගතයන් වහන්සේගේ ධර්මාන සමය තුළ උන්වහන්සේ විසින් නිශ්චිත නිදානයක් ඇසුරින් කළ පැනවීමක් නොවන බව විනය පිටකාගත ප්‍රාථමික මූලාශ්‍රයන්හි කිසිදු ආකාරයේ එවැනි ප්‍රඥප්තියක් පිළිබඳ සඳහන් නොවීමෙන් තහවුරු කරගත හැකි ය. කෙසේ වෙතත් ලාංකික බුද්ධශාසන පරිහානිකර යුගයේ ඊට පිළියම් වශයෙන් අවස්ථා කීපයක දී සියම් දේශයෙන් උපසම්පදාව රැගෙන ඒමට කළ උත්සාහයේ ප්‍රතිඵල වශයෙන් එවකට කන්ද උඩරට පාලකයා වූ කීර්තී ශ්‍රී රාසිංසිංහ රජසමයේ සියම් උපාලි මහතෙරුන්ගේ ප්‍රධානත්වයෙන් මහනුවර මල්වතු

21. මහෝදරස්ස නාගසස තථා චූලෝදරස්සච - මාතුලභාගිනෙය්‍යානං මණිපල්ලංකහේතුකං මහාසංසය, ඉහත සඳහන් සංස්කරණය, 46 ගාථාව, 04 පිටුව.

22. කල්‍යාණිචේතියට්ඨානේ කතේ රතනමණ්ඩපේ මහාරහම්හි පල්ලංකේ සහ සංඝේනුපාවිසී, එම 06 පිටුව

23. විජේසුන්දර කල්‍යාණි, ඩබ්.එම්., *ලක්දිව නාග ජනයා පිළිබඳ ඓතිහාසික සහ සාහිත්‍ය විමර්ශනයක්* (2021), THE JOURNAL OF LANGUEGE AND CULTURE V 1 issus 1 Rajarata University of Srilanka.

මහාවිහාරයීය උපෝෂථාගාරයෙදී වර්ෂ 1753 ජූලි 19 දින උපසම්පදා විනය කර්මය නැවත ආරම්භ කළ අතර එහි දී සියමෙන් පැමිණි භික්ෂු කණ්ඩායම සමඟ සිටි නාග නම් සාමණේරයන් වහන්සේ පළමු ව[24] උපසම්පදාවේ පිහිටවූ අතර එම අවස්ථාව සනිටුහන් කිරීමක් වශයෙන් උපසම්පදාපේක්ෂක සාමණේරයන් වහන්සේව නාග නමින් ව්‍යවහාර කිරීමට සංඝ සම්මුතියක් ඇති කරගෙන ඇත. විශේෂයෙන් උපසම්පදා විනය කර්මයක දී ඊට අදාළ මූලික විනයානුකූල පදනමට හානි නොවන පරිදි ඒ ඒ ප්‍රදේශ ව්‍යවහාරානුකූල වීමට සාමූහික භික්ෂු සංඝයා විෂයයෙහි විනයෙන් ලැබෙන අවසරය[25] අනුව උපසම්පදාව අපේක්ෂාවෙන් පැමිණෙන සාමණේරයන් වහන්සේ සම්බන්ධ ව සුදුසුකම් පරීක්ෂාවෙන් අනතුරු ව රාජාභරණ විභූෂිත ව ගිහි වෙස් ගැන්වේ. එවිට මුලින් ගිහිභාවයේ සිටි අවදිය හා සාමණේර බවට පත්වීමේ දී භාවිත කරන ලද නම්ගොත් මෙම අවස්ථාවේ අතහැර දැමීමට ද අවස්ථාව ලැබේ. කෙසේ වෙතත් ගිහි බවට පත්කල සාමණේරයන් වහන්සේ නැවත විනයානුකූලව පැවිදි බවට පත්කෙරේ. අනතුරුව උපසම්පදාවට අදාළ වන කටයුතුවලට යොමුවන අතර එහි දී අදාළ නම් යොදා කර්මවාක්‍ය ප්‍රකාශ කිරීමේ අපහසුව නිසා මෙම සංක්‍රාන්තික කාලය තුළ උපසම්පදාපේක්ෂක සාමණේරයන්ට ඉහත නාග සම්මුතිය ලැබේ.[26]

විශේෂයෙන් මෙරට පැවැති විදේශාක්‍රමණිකයින්ගේ ග්‍රහණය මෙන් ම රාජානුග්‍රහය නොලැබී යාමත් ශාසනික ප්‍රතිපදාවෙන් භික්ෂූන් වහන්සේ දුරස් ව පැවැතීමත් නිසා ශාසනික පරිහානිය කලක් තිස්සේ දැඩි ව සමාජගතව පැවැති සංසිද්ධියකි. මෙවැනි තත්ත්වය තුළ උපසම්පදා කර්මය නැවත ඇරඹීම පිළිබඳ මහත් සේ සතුටට පත්ව සිටි ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා මීට පූර්ණ අනුග්‍රහ දැක්වීම සඳහා විශේෂ උනන්දුවකින් පසුවූ බව පෙනේ. ඉහත සඳහන් පරිදි නාග සම්මුතිය ලැබූ සාමණේරයන් වහන්සේ උපසම්පදාව ලැබීමට පළමු ව රාජපුත්‍රයකු ලෙස සැරසී උපසම්පදා මංගලෝත්සවය සඳහා

24. *මන්දාරම්පුර පුවත* (1958), ලංකානන්ද සංස්කරණය, 678 කවිය
25. චන්දවිමල හිමි, රේරුකානේ, *විනය කර්ම පොත* (2005), ශ්‍රී චන්‍දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, 43 පිටුව
26. එම 42 පිටුව

යොමු වේ. එහි පළමු උත්සවය රජතුමාගේ අනුග්‍රයෙන් රජමාලිගාවේ සිට උපෝෂථාගාරයට රාජකීය පෙරහරකින් ගමන් කරමින් සිදුවූ බව දක්වේ. එහි ප්‍රතිඵල වශයෙන් ඒ ඒ වර්ෂයන්හි පළමු ව උපසම්පදාව ලබන උභය විහාරයීය සාමණේරයන් වහන්සේලා පස්නම බැගින් දස නමක් වෙනුවෙන් පවත්වන උත්සව සඳහා රජුගේ අනුග්‍රහය ලබා දී ඇත. ඒ අනුව රජමාලිගාවෙන් නාගයා රැගත් පෙරහැරක් සංවිධානය වේ. රජවාසලෙන් පැමිණෙන නාග යන අදහසින් වාහලනාග යන ව්‍යවහාරය මීට ලැබී ඇත. එම අවස්ථාව ක්‍රියාවට නැංවීමක් වශයෙන් දියවඩන නිළමේ තුමා හා දළඳා මාළිගාව සම්බන්ධ කරගෙන වර්තමානයේ මෙම සිරිත ක්‍රියාවට නැංවේ.

නාග ලෝකයේ වාසය කරන සත්වයින් වෙසෙසීම පිණිස ද නාග යන වචනය යෙදේ.නාග ලෝකය වශයෙන් සැලකෙන ජීව ලෝකයක් පිළිබඳ නූතන විද්‍යාත්මක විමර්ශන නිශ්චිතව හඳුනාගත නො හැකි වුව ද බෞද්ධ සාහිත්‍යාගත මූලාශ්‍රයානුසාරයෙන් මේ පිළිබඳ විග්‍රහ කිරීමේ හැකියාව පවතී. ඒ අනුව දිනක් තථාගතයන් වහන්සේ හමුවන පහාරාද නම් අසුරේන්‍ද්‍රයා බුදුරදුන් සමඟ තම වසභවනය වූ මහාසමුද්‍රාගත පාරිසරික අසිරිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන අතරතුර එහි වාසය කරන සත්ත්වයින් පිළිබඳ කෙරෙන විස්තරයේ නාගයින් ද සමුද්‍රගත ව වාසය කරන පිරිසක් ලෙස දක්වේ.[27] පහාරදගේ මෙම විග්‍රහය සමඟ ගැළපීමේ දී නාග යනුවෙන් අදහස් වන්නේ එක්තරා අසුර නිකායක් වශයෙන්ද සැලකිය හැකි බව මෙහි ලා අවධාරණය කළ යුතු ය. මේ හැරුණුවිට දීඝනිකායේ ආටානාටිය සූත්‍රයේ දක්වෙන (මෙහි ඉදිරියේ දී සාකච්ඡාවට ගැනෙන) සඳහනකට අනුව බුදුරදුන් හමුවීමට පැමිණෙන සතරවරම් දෙවිවරුන් අතුරින් විරූපාක්ෂ දෙවියන් ඇතුළු නාගසමූහයාට අයත් නාගලෝකය බටහිරදිශා භාගයේ ගැඹුරු මහමුහුදේ පිහිටි බව සඳහන් වේ.[28] බෞද්ධ සංස්කෘතියේ දෙවියන්ට පුණ්‍යානුමෝදනා කිරීමෙහි ලා භාවිත වන

27. යම්පිහන්තේ මහා සමුද්දෝ මහතං භූතානං ආවාසෝ . තත්‍රිමේ, තිමි තිමිංගලා තිමිරපිංගලා, අසුරා, නාගා, ගන්‍ධබ්බා. අංගුත්තර නිකාය, පඤ්චම භාගය (2005), පහාරාද සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 86 පිටුව.

28. යස්ස චොග්ගතෝ සුරියෝ සංවරීති පවුච්චතී රහදෝපි තත්ථ ගම්භීරෝ සමුද්දෝ සරිතොදකෝ, දීඝනිකාය තෘතීය භාගය (2005), ආටානාටිය සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 318 පිටුව

ගාථා පාඨයේ දක්වෙන 'දේවා නාගා මහිද්ධිකා' (මහත් ඍද්ධියක් ඇති දෙවියෝද නාගයෝ ද) යන ව්‍යහාරයට අදාළ ව දෙවියන් හැරුණුවිට ඍද්ධිමත් නාගයින් අසුර විශේෂයක් වශයෙන් සැලකීමේ යුක්තියක් පවතින බව පෙනේ.

නාග සංකල්පයේ තවත් සුවිශේෂිත පසුබිමක් වශයෙන් බෞද්ධ සංස්කෘතියේ ප්‍රචලිත ඉහතින් ද සඳහන් කළ සිව්වරම් දේව සංකල්පය සමග බද්ධ ව පවතින බව හඳුනාගත හැකි ය. බෞද්ධ සංස්කෘතියේ ව්‍යවහාර ව පවතින දේව සංකල්පය වනාහි හුදෙක් ම ඊට ම ආවේණික පසුබිමක් තුළ දැකගත හැකි සංසිද්ධියක් බව පෙනේ. ඒ අනුව හින්දු සම්පර්කය තුළින් මෙන් ම අනාර්ය සභ්‍යත්වය හා වෙනත් අතිරේක සාධක ඇසුරින් සමාජගත ව පවතින දේව සංකල්පය බෞද්ධ සංකල්ප සමග සමීකරණය වීමේ ප්‍රවණතාව අවධාරණය කළ යුතු ය. මීට අදාළ කරගත හැකි නිදර්ශන සමාජ පසුබිම කෙරෙන් ම තහවුරු කරගත හැකි ය. ඒ අතර ශක්‍ර සංකල්පය මෙහි ලා ඉදිරිපත් කළ හැකි ප්‍රබල නිදර්ශනයකි. රෞද්‍ර ගති සහිත ප්‍රාණඝාතාදියෙහි නියුතු දුසිරිතෙහි එකග වූ සතුරන් විනාශ කිරීමේ රුචි වූ රණකාමී දෙවියකු වශයෙන් හින්දු දහමේ අභිමන් ලබන ඉන්ද්‍ර දෙවියන් බෞද්ධ පදනම තුළ ශක්‍ර බව සමග සමීකරණය වීමේ දී අතිශයින් කරුණාබරිත වූ එ මෙන් ම සත්පුරුෂ ධර්මයෙහි තත්පර වූ සත්පුරුෂයින්ගේ විපතකදී වහා පිහිටවීමේ ගුණයෙන් යුතු පෙහෙවත් වත් ආරක්‍ෂා කරන පරිපූර්ණ උපාසක බවකින් යුතු සංකල්පයක් වශයෙන් සැලකේ. මෙවැනි පසුබිමක් තුළ විවිධ තත්ත්ව යටතේ ප්‍රසිද්ධ දේව චරිත තෙරුවන් සරණ යාම මගින් බෞද්ධ පසුබිමට නැඹුරු වන පරිදි සකස් කරගැනීමේ ප්‍රවණතාවක් ක්‍රියාත්මක වීමේ සංස්කෘතික පදනමක් පැවැති බව හඳුනාගත හැකි ය. සතරවරම් දෙවියන් පිළිබඳ විග්‍රහය යථෝක්ත පසුබිම ඇසුරින් විමර්ශනය කිරීමේ හැකියාව පවතී. ආටානාටිය සූත්‍රයේ සඳහන් වන ආකාරයට තථාගතයන් වහන්සේ හමුවීම සඳහා යක්‍ෂ, ගාන්ධර්ව, කුම්භාණ්ඩ හා නාග ආදීන්ගෙන් සමන්විත සේනාවන් හතරක් සහිත ව සිව්වරම් දෙවිවරු පැමිණි බව දක්වේ.[29] මේ අතුරින් ධෘතරාෂ්ට්‍ර දෙවියෝ නැඟෙනහිර දිශාවේ ආරක්‍ෂාව සපයති. විරූඪ දෙවියෝ, දකුණු දිශාව

29. අථ ඛෝ චත්තාරෝ මහාරාජා මහතියාච යක්ඛ සේනාය, මහතියාච ගන්ධබ්බ සේනාය මහතියාච කුම්භණ්ඩ සේනාය මහතියාච නාග සේනාය... දීඝනිකාය තෘතීය භාගය ඉහත සඳහන් සංස්කරණය, 312 පිටුව

ආරක්ෂා කරති. එ මෙන් ම විරූපාක්ෂ බස්නාහිර ද වෛශ්‍රවන උතුර දිශාව ද රැකවල් සපයන බව කියැවේ.[30] විශේෂයෙන් මෙම දෙවිවරු ඉහත සඳහන් පරිදි සිව් දිශාවලට ආරක්ෂාව සැපයීම සඳහා ශක්‍ර දේවේන්ද්‍රයාගෙන් වරම් ලැබූ අධිපති දෙවිවරුන් ලෙස සැපකේ. එ මෙන් ම ගුණධර්ම රකින පිරිස්වලට ආරක්ෂාව සැපයීම මොවුන්ගේ වගකීම යි. මේ හැරුණු විට මිනිසුන් විසින් සිදු කරනු ලබන පුණ්‍යක්‍රියා සටහන් කරගෙන ඒවා ශක්‍ර දේවේන්ද්‍රයා වෙත දැන්වීම ද වරම් දෙවිවරුන්ගේ මූලික කාර්යභාරය බවට පත්ව ඇත. ප්‍රස්තුතයට අදාළ ව බටහිර දිශාවේ රැකවරණය පිළිබඳ වගකීම පවතින විරූපාක්ෂ දෙවියන්ට භාරව ඇත්තේ මිනිසුන්ගේ ඉවසීම පිළිබඳ දැන්වීම ය.[31] ඔහු නාගයන්ට අධිපති දෙවියන් ය.[32] ගංගා ජලය පිවිසුණු ගැඹුරු මුහුදේ නාග ලෝකය පිහිටා ඇති බව සඳහන් වේ. ඉහත සඳහන් පහාරාද සූත්‍රයේ වූ විස්තරය ද මීට ද අදාළ කරගත හැකි ය.[33] ශ්‍රී ලාංකේය බෞද්ධ ශිල්ප කලා විෂයයෙහි සිව්වරම් දෙවියන්ගේ භාවිතාව වඩාත් ප්‍රකට ව දැකගත හැකි ය. එයින් බහුතරයක් බෞද්ධ පූජනීය ස්ථාන ආශ්‍රිත ව මීට අදාළ නොයෙකුත් නිර්මාණ දැකගත හැකි ය. එ මෙන් ම පරිත්ත සජ්ඣායනය ආදී කොට ඇති බෞද්ධ සංස්කෘතික පූජා චාරිත්‍ර ආශ්‍රිත ව ද පොදුවේ සතරවරම් දෙවිවරුන්ගේ භාවිතාව දැකගත හැකි ය. විශේෂයෙන් බෝසත් සිරිත මෙන් ම බුදු සිරිතේ විවිධ සිදුවීම් සමඟ සිව්වරම් දෙවිවරුන්ගේ සබැඳියාව පිළිබඳ තොරතුරු හඳුනාගත හැකි ය.

පුරාවිද්‍යාත්මක ගවේෂණ මගින් කණ්ටක ස්තූපයේ දකුණුදිග වාහල්කඩ ආශ්‍රයෙන් හඳුනාගෙන ඇති දැත හා හිස වටා නයිපෙණවලින් යුක්ත ව රාජකීය ඇඳුම් ආයිත්තම්වලින් විභූෂිත ව මිනිස් හෝ දේව ස්වරූපිත ව නිමවන ලද වෘෂභ වාහනය ද සහිත දොරටුපාල රූපය මගින් විරූපාක්ෂ දෙවියන් මූර්තිමත් කෙරෙන බව පිළිගැනේ.[34] එ මෙන් ම ජේතවන ස්තූපයේ දකුණු හා නැගෙනහිර වාහල්කඩ නාග

30. එම 314-324 පිටු
31. ජාතකට්ඨකථා 4 ( 1926), හේවාවිතාරණ මුද්‍රණ, 129 පිටුව
32. නාගානං ආධිපතී විරූපක්ඛෝ ඉති නාමසෝ, දීඝනිකාය තෘතීය භාගය, ඉහත සඳහන් ග්‍රන්ථය, 314 පිටුව
33. රහදෝපි තස්සගම්භීරෝ සමුද්දෝ සරිතෝදකෝ, එම, 318 පිටුව
34. වික්‍රමගමගේ චන්ද්‍රා (2006) *ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව*, ගොඩගේ සහ සමාගම, කොළඹ, 184 පිටුව

පෙණ සහිත රූප දැකගත හැකි ය. එම රූපවලට පහළින් ස්ත්‍රී රූප ද දෘශ්‍යමාන වේ. දිසාපාලක දෙවිවරුන් සහ ඔවුන්ගේ භාර්යාවන් එයින් නිරූපණය වන බව විශ්වාසය යි.[35] විශේෂයෙන් දිසා පාලක දෙවිවරුන් නිරූපණය කිරීමේ දී නාගරූප වශයෙන් පොදුවේ සංකේතවත් කිරීමට උනන්දු වී ඇති අයුරු ද මෙහි ලා විශේෂයෙන් අවධානයට ලක්විය යුතු වේ. බෞද්ධ පූජනීය ස්ථාන ආශ්‍රිත ව දක්නට ලැබෙන මුරගල නිර්මාණ පරීක්ෂා කිරීමෙන් මෙම අදහස වඩාත් තහවුරු කරගත හැකි ය. සාමාන්‍යයෙන් වෛශ්‍රවන හැරුණුවිට විරූඪ ප්‍රමුඛ අනෙක් තිදෙනා ම නාග ප්‍රභවයක් සහිත දෙවිවරුන් වශයෙන් හඳුනාගත හැකි ය.[36] වෛශ්‍රවන වනාහි යක්ෂ ප්‍රභවයක් සහිත දෙවියෙකි. එබැවින් මෙම දිසා පාලක රූප මානවාකාරයෙන් නිර්මාණය කිරීමට පළමු ව ඒ සඳහා නාගරූප යොදා ඇති බව පෙනේ. කෙසේ වෙතත් මේවායේ සමතුලිතතාව ආරක්ෂා කරගැනීම සඳහා වෛශ්‍රවන සඳහා ද පොදුවේ නයිපෙණ භාවිත කර ඇති බව පිළිගැනේ.[37] මෙවැනි තත්ත්වයක් තුළ එක ම ආකාරයේ දොරටුපාල රූප දැකිය හැකි විය. එහෙයින් ඊට විකල්ප වශයෙන් දිශාව නියෝජනය කෙරෙන සත්ත්වරූප නිර්මාණයට යොමු වී ඇති අයුරු දැකගත හැකි ය. ඒ අනුව පෙරදිග, බටහිර, උතුර හා දකුණ යන දිසාවලට පිළිවෙළින් ඇතා, අශ්වයා, සිංහයා සහ ගවයා වශයෙන් නිරූපණය කර ඇත. සංස්කෘතිකමය වශයෙන් සැලකීමේ දී සතරවරම් දෙවිවරු හින්දු දේව සංකල්පයෙන් බැහැර වූ ස්වභාවයක් ගනී. එබැවින් සුර හෙවත් දේව සණයට අයත් නොවන ඒ නම් අසුර ව්‍යවහාරයක් එහි දක්නට ලැබෙන බව සඳහන් කළ හැකි ය. එහෙයින් ප්‍රතිවෛදික සභ්‍යත්වය තුළ සම්භාවිත ප්‍රධාන සංකල්ප අතර යක්ෂ හා රාක්ෂ භාවය හරුණවිට අනෙක් බලවේගය ලෙස නාග සංකල්පයට අදාළ කරගෙන ඇති බව පෙනී යයි.

## නිගමනය

සමස්තයක් වශයෙන් සැලකීමේ දී නාග සංකල්පය වනාහි සමාජයේ බහුවිධ දෘෂ්ටිකෝණ ඇසුරින් විග්‍රහ කිරීම්වලට භාජනය වූ ප්‍රස්තුතයක් බව ප්‍රකට ය. ඇතැමෙක් මෙම ප්‍රස්තුතය සම්බන්ධ

35. එම 108 පිටුව

36. දීඝනිකාය, තෘතීය භාගය ආටානාටිය සූත්‍රය, ඉහත සඳහන් සංස්කරණය, 320-324 පිටු

37. වික්‍රමගමගේ චන්ද්‍රා, ඉහත සඳහන් කෘතිය, 108 පිටුව

ව අවඥා සහගත හා හාස්‍යජනක ලෙස දැකීමට උනන්දු වෙති. තවත් අයෙක් අතිශයෝක්තික විවරණ ද ගෙනහැර දක්වති. එබැවින් ඒ පිළිබඳ දෘශ්‍යමාන සාධක හා නිශ්චිත ව තහවුරු කරගත් සාක්ෂි නොමැතිකමත් පදනම් ව සැලකීමේ දී යථෝක්ත අන්තවාදී හෝ කාල්පනික එළඹුම් ප්‍රකට වීම සාමාන්‍ය සංසිද්ධියක් වශයෙන් සැලකිය හැකි ය. එහෙත් නාග සංකල්පය වූ කලී පොදුවේ බහුවිධ ක්ෂේත්‍ර කෙරෙන් ප්‍රකට වූ මාතෘකාවක් වශයෙන් අර්ථකථනය කළ හැකි ය. එ මෙන් ම අවස්ථාවෝචිත ව ඒ ඒ ක්ෂේත්‍රවලට සාපේක්ෂ ව භාවිත වන සංකල්පයක් ලෙස ද සැලකිය හැකි ය. බෞද්ධ සංස්කෘතියේ ව්‍යවහාර වන නාග සංකල්පය හුදෙක් ම පර්යාය වශයෙන් යෙදෙන භාවිතාර්ථයට සාකල්‍යයෙන් ම ගැළපෙන ලෙස විග්‍රහ වී ඇති බව පෙනේ. එබැවින් හුදෙක්ම නාග සංකල්පය පරිපූර්ණ වශයෙන් ම මිථ්‍යා විශ්වාසයක් නොවන බව බෞද්ධ විග්‍රහය ඇසුරින් නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


**ප්‍රාථමික මූලාශ්‍රය**

- *දීඝනිකාය තෘතීය භාගය* (2005), බු.ජ.ත්‍රි.ග්‍ර. පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
- *මන්දාරම්පුර පුවත* (1958), ලබුගම ලංකානන්ද ථෙර සංස්කරණය
- *මහාවග්ගපාළි ප්‍රථම භාගය* (2006), බු.ජ.ත්‍රි.ග්‍ර. පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල
- *මහාවංසය* (1959), පොල්වත්තේ බුද්ධදත්ත හිමි සංස්කරණය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම
- *සමන්තපාසාදිකා* (1929), හේවාවිතාරණ මුද්‍රණ
- *සංයුත්ත නිකාය චතුර්ථ භාගය* (2006), බු.ජ.ත්‍රි.ග්‍ර. පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල
- *සංයුත්තනිකායට්ඨ කථා* (1929), හේවාවිතාරණ මුද්‍රණ

**ද්විතීයික මූලාශ්‍රය**

- චන්දවිමල හිමි, රේරුකානේ, *විනය කර්ම පොත* (2005), ශ්‍රී චන්‍දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, පොකුණුවිට
- වික්‍රමගමගේ චන්ද්‍රා (2006), *ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව*, ගොඩගේ සහ සමාගම, කොළඹ

- විජේසුන්දර කල්‍යාණී, ඩබ්.එම්., *ලක්දිව නාග ජනයා පිළිබඳ ඓතිහාසික සහ සාහිත්‍ය විමර්ශනයක්* (2021) THE JOURNAL OF LANGUEGE AND CULTURE, VI issus 1, Rajarata University of Sri Lanka
- විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, *සිංහල භාෂාවේ ඉතිහාසය* (1965), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ
- විජේවර්ධන ජී. විජේවර්ධන, හා මීගස්කුඹුර. පී.බී., *සියම් ලංකා ආගමික සම්බන්ධතා* (1993), ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ

**කෝෂ ග්‍රන්ථ**

- බණ්ඩාර, සිරිනාම ඒ.ජී. (2006), *බුදුගුණ නාමාවලී,* බුද්ධනාම විශ්වකෝෂය, කර්තෘ ප්‍රකාශන
- ලියනගේ, සිරි, *බෞද්ධ ශබ්දකෝෂය* (2014), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල
- සෝරත නාහිමි, වැලිවිටියේ, *සුමංගල ශබ්දකෝෂය 2* (1952), මහාබෝධි යන්ත්‍රාලය, කොළඹ